ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>සුවසැරිය පදනම සඳහා වෛද්‍ය සැපයුම් භාර දේ</u>

ඉන්දියානු රජය විසින් 1990 සුවසැරිය ගිලන්රථ සේවාව වෙත පරිත්‍යාග කරන ලද ටොන් 3.3 ක අත්‍යාවශ්‍ය වෛද්‍ය සැපයුම් තොගයක් මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් සුවසැරිය පදනමේ සභාපති දුමින්ද රත්නායක මහතා වෙත 2022 ජූනි 3 වන දින කොළඹ දී භාර දෙන ලදී. පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හර්ෂ ද සිල්වා සහ සුවසැරිය පදනමේ ප්‍රධාන විධායක නිලධාරී සොහාන් ද සිල්වා යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා 2022 මාර්තු මස කොළඹ සුවසැරිය මූලස්ථානය වෙත ගිය අවස්ථාවේදී එහි නිලධාරීන් විසින් සුවසැරිය පදනම විසින් නුදුරේදීම මුහුණ දෙන වෛද්‍ය සැපයුම් හිඟය පිළිබඳව එතුමා දැනුවත් කරන ලදී. මෙම හදිසි අවස්ථාවට ප්‍රතිචාර දක්වමින් වෛද්‍ය සැපයුම් ශ්‍රී ලංකාවට කඩිනමින් භාරදීම සඳහා ඉන්දියානු නාවික හමුදාවේ ඝාරියල් නෞකාව විශේෂයෙන්ම යොදවන ලදී. සුවසැරිය පදනමට අමතරව හම්බන්තොට මහා රෝහල, පේරාදෙණිය ශික්ෂණ රෝහල සහ යාපනය ශික්ෂණ රෝහලට අවශ්‍ය වෛද්‍ය සැපයුම් ද මෙම නෞකාව විසින් රැගෙන එන ලදී.

3. ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරාම ව්‍යාප්ත 1990 සුවසැරිය හදිසි ගිලන්රථ සේවාව ජනතා කේන්ද්‍රීය සහ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයන් පදනම් කරගත් ඉන්දීය සංවර්ධන සහයෝගීතාවය සඳහා දිදුලන නිදසුනකි. ඉන්දියානු රජයේ ඇමරිකානු ඩොලර් මිලියන 22ක පමණ ප්‍රදානයක් යටතේ මෙම ගිලන්රථ සේවාව ආරම්භ කරන ලදී. මෙම සේවාව ශ්‍රී ලංකාවේ ජනතාවට අතිශය වැදගත් සේවාවක් බව මේ වන විට සනාථ වී ඇති අතර එය වටිනා ජීවිත බේරාගැනීමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

4. ඉන්දීය රජය සහ ජනතාව විසින් පසුගිය මාස දෙක තුළදී ශ්‍රී ලංකාවට පරිත්‍යාග කරන ලද ටොන් 25ක ඖෂධ සහ වෛද්‍ය සැපයුම්වල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් මිලියන 370කට ආසන්නය. මෙම වෛද්‍යාධාර ලබා දී ඇත්තේ සහල්, කිරි පිටි, භූමිතෙල් වැනි මානුෂීය ආධාර සහ ඇමරිකානු ඩොලර් බිලියන 3.5ක පමණ ආර්ථික සහයෝගයට අමතරව වීම විශේෂත්වයකි.

***

***කොළඹ***
***2022 ජූනි 03***